සරසවියේ නවක වධය හේතුවෙන් සිය ජීවිතය තොරකරගත් බව කියැවෙන සිසුවියගේ ප්‍රවෘත්තිය මේ වනවිට නැවතත් කරළියට පැමිණ ඇත. ඒ සම්බන්ධයෙන් නැවත පරීක්ෂණ පවත්වන ලෙසින් වූ ඉල්ලීම සහ එම සිසුවිය අවසානයට ලියා තැබූ ලියුම නැවත අවධානයට පාත්‍ර වීමත් සමගින්, ඒ සම්බන්ධයෙන් වූ ලිපි ගණනාවක් මෙම දින කිහිපය තුළ දක්නට ලැබිණි. මෙහිදී දිවයින පුවත්පතෙහි ඒ සම්බන්ධයෙන් වූ ලිපියක් කෙරෙහි අවධානය යොමු කිරීම වටී. තවමත් විධිමත් පරීක්ෂණයකින් පසුව මෙම සිදුවීමේ වරදකරුවන් නම් කොට නැතත්, එම සිසුවිය ලියූ ලිපිය සහ වෙනත් කරුණු කාරණා සමගින් එම සරසවියේම සිටි තවත් සිසුවියන් දෙදෙනෙකු වරදකරුවන් ලෙසින් නම් කෙරී ඇති අයුරු මෙම ලිපිය තුළද දක්නට ඇත. ගවේෂණාත්මකව සත්‍යය මතුකොට දැක්වීමට ජනමාධ්‍ය විසින් සිදුකරනා කාර්ය භාරයක් ඇත. එය අවිවාදාත්මක වේ. කෙසේ නමුත් විධිමත් පරීක්ෂණයක ප්‍රතිඵල ඔස්සේ වරදකරුවන් බවට පත් කිරීමට පෙර, සැකකරුවන් දෙදෙනෙකු වරදකරුවන් ලෙසින් හංවඩු ගැසීම යෝග්‍යද? එසේත් නැතිනම් ඉදිරිපත් වී ඇති කරුණු ඔස්සේ ඔවුන් දැනටමත් වරදකරුවන් බවට තීරණය කිරීමට ජනමාධ්‍ය සහ ජනතාව අත අයිතියක් ඇතිද? එසේම මෙවැනි භාෂා භාවිතයක් එම සැකකරුවන්ව හැඳින්වීම සඳහා භාවිතය යෝග්‍ය වේද? යෝග්‍ය නොවේද? ඒ පිළිබඳව පාඨක ඔබේ අදහස කුමක්ද?

**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #September9**